ශීර්ෂය 176 - වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 176 - වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 26 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 29 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

වරාය නාවික හා ගුවන්සේවා අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන වලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන

පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

  මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

3.1.1 ප්‍රතිපාදන උපයෝජනය

3.1.1.1 පුනරාවර්තන වියදම්

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මනා ලෙස ඇස්තමේන්තු නොකිරීම හේතුවෙන් මුදල් රෙගුලාසි 66 යටතේ වැය විෂයයන් 14 ක ඇස්තමේන්තුගත එකතුව රු.274,100,000 ක ප්‍රතිපාදනයෙන් එකතුව රු.28,021,473ක් වූ ප්‍රතිපාදනය වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි. එය සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 15 සිට සියයට 100 දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.	අමාත්‍ය කාර්යාලයේ හා අමාත්‍යාංශයේ වැටුප් හා වෙතන, අතිකාල දීමනා රජයේ වෙනස්කම් හේතුවෙන් පිරිවැය ඉතිරිවීමත් හා අතිකාල වියදම් සීමා කිරීම නිසාද වැය විෂයය අංක176-1-1-0-1202-0/11 අමතර ඉන්ධන පිරිවැය සීමා කිරීමත් වැය විෂයය අංක176-1-1-0-1502-0/11 ඇතැම් සේවකයන් රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදලේ ලියාපදිංචි වී නොමැති වීමත් 176-1-2-1102-0/11 වැය විෂයය යටතේ අයවැය කළමනාකරණ චක්‍රලේඛවලට අනුව වියදම් සීමා කිරීමත් වැය විෂය 4 ක් වන ඉන්ධන, ආහාර පාන හා නිල ඇඳුම්, වාහන හා වෙනත් වියදම් සඳහා අපේක්ෂිත පරිදි වියදම් දැරීමට සිදු නොවීමත් 176-1-2-0-1403-0/11 වැය විෂයය සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ජල හා විදුලි බිල්පත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොවීමත් 176-1-2-0-1503-0/11 වැය විෂයය සඳහා අපේක්ෂිත පරිදි ගෙවීම් කිරීමට සිදු නොවීම.	මු.රෙ 50 අනුව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී ඒවා මුදල් වර්ෂය තුළ ඉටු කළ හැකි ශක්තිය ඇතුළත බව තහවුරු කරගත යුතු අතර වෙන්කරගත් ප්‍රතිපාදන වර්ෂය තුළදී අපේක්ෂිත කර්තව්‍ය සඳහා උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු බව.

(ආ)	වැය විෂයයන් 04 කට අදාළව වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් එකතුව රු.3,100,000 ප්‍රතිපාදන සලසා ගෙන තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ප්‍රතිපාදනයෙන් කිසිදු උපයෝජනයක් සිදුකර නොතිබුණි.	වැය විෂයය අංක 176-1-1-0-1203-0/11 නිලධාරීන් නිලඇඳුම් දීමනාව ඉල්ලුම් නොකිරීම, වැය විෂයය අංක 176-1-1-0-1403-0/11 ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ජල හා විදුලි බිල්පත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකිරීම, 176-1-1-0-1404-0/11 යටතේ අපේක්ෂිත පරිදි වියදම් දැරීමට සිදු නොවීම හා වැය විෂයය අංක 176-1-1-0-1502-0/11 හි ඇතැම් සේවකයන් රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදලේ ලියාපදිංචි වී නොමැති වීම.	මු.රෙ 50 අනුව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී ඒවා මුදල් වර්ෂය තුළ ඉටු කළ හැකි ශක්තිය ඇතුළත බව තහවුරු කරගත යුතු අතර වෙන්කරගත් ප්‍රතිපාදන වර්ෂය තුළදී අපේක්ෂිත කර්තව්‍ය සඳහා උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු බව.
(ඇ)	වැය විෂයයන් 14 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.181,248,527ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව රු.85,323,281 ක් ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම නිසා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 32 සිට සියයට 88 දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.	වැටුප් හා වේතන, අතිකාල දීමනා, විදේශීය ගමන් වියදම් සඳහා රජයේ වෙනස්කම් හේතුවෙන් පිරිවැය ඉතිරිවීමත්, අයවැය කළමනාකරණ චක්‍ර ලේඛවලට අනුව වියදම් සීමා කිරීමත් ඉන්ධන හා ප්‍රවාහන වැය විෂයය සඳහා අමතර ඉන්ධන පිරිවැය සීමා කිරීමත් ප්‍රවාහන දීමනාව වෙනුවට පවරා ඇති වාහන ලබාගැනීමත් තැපැල් හා සංනිවේදන, මාරුකිරීම්, ඉන්ධන හා වාහන සඳහා අපේක්ෂිත පරිදි වියදම් දැරීමට සිදු නොවීමත් 176-1-2-0-1403-0/11 වැය විෂය සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විදුලි හා ජල බිල්පත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකිරීම.	මු.රෙ 50 අනුව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී ඒවා මුදල් වර්ෂය තුළ ඉටු කළ හැකි ශක්තිය ඇතුළත බව තහවුරු කරගත යුතු අතර වෙන්කරගත් ප්‍රතිපාදන වර්ෂය තුළදී අපේක්ෂිත කර්තව්‍ය සඳහා උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු බව.

3.1.1.2 ප්‍රාග්ධන වියදම්

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේ දී 176-1-2-0-2103 වැය විෂයය සඳහා රු.1,000,000 ක ප්‍රතිපාදන සලසාගෙන තිබු අතර මනා ලෙස ඇස්තමේන්තු නොකිරීම හේතුවෙන් එම ප්‍රතිපාදනයෙන් රු.209,345ක ප්‍රතිපාදන මුදල් රෙගුලාසි 66 යටතේ වෙනත් වැය විෂයන්ට මාරුකර තිබුණි. එය	වැය විෂයය අංක 176-1-2-0-2103-0/11, 176-1-2-0-1203-0/11 අපේක්ෂිත පරිදි වියදම් දැරීමට සිදු නොවීම.	මු.රෙ 50 අනුව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී ඒවා මුදල් වර්ෂය තුළ ඉටු කළ හැකි ශක්තිය ඇතුළත බව තහවුරු කරගත යුතු අතර වෙන්කරගත් ප්‍රතිපාදන වර්ෂය තුළදී අපේක්ෂිත කර්තව්‍ය සඳහා

	සලසාතිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 21 ක් විය.		උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු බව.
(ආ)	වැය විෂයයන් 05 කට අදාළව වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් එකතුව රු.4,745,000,000ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ප්‍රතිපාදනයෙන් කිසිදු උපයෝජනයක් සිදුකර නොතිබුණි.	වැය විෂයය අංක 176-1-1-0-2002-0/11 සඳහා අපේක්ෂිත පරිදි වියදම් දැරීමට සිදු නොවීම සහ වැය විෂයය අංක 176-2-4-21-2104-0/17 හා 176-2-4-21-2302-0/12 කන්කසන්තුරේ වරාය ජැටිය සහ අනෙකුත් යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය 2020 ඔක්තෝබර් මස ආරම්භ කරන ලද අතර මුල් සැලසුම් කටයුතු, පූර්ව සුදුසුකම් ලේඛණය සහ විස්තරාත්මක ව්‍යාපෘති වාර්තාව සම්පූර්ණ කර ඇත. පූර්ව සුදුසුකම් ලේඛනය සහ ණය දිගු කිරීම සඳහා ඉන්දියාවේ EXIM බැංකුවේ අනුමැතිය ලබා ගැනීම බලාපොරොත්තු වන අතර, ව්‍යාපෘතිය එදින සිට අද දක්වා ක්‍රියාවිරහිත තත්වයක පවතී. මෙයට පිළියමක් ලෙස, ඉන්දියානු රජය ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 63.65ක ප්‍රදානයක් යෝජනා කර ඇත. කෙසේ වෙතත්, මෙම දීමනාව තවමත් අවසන් කර නොමැත. වැය විෂයය අංක 176-2-4-24-2104-0/17 සඳහා අවසාන ගෙවීම 2024 වර්ෂයේදී සිදු කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, විචල්‍ය අයිතම ප්‍රමාණය පිළිබඳ සාකච්ඡා හේතුවෙන් මෙම ක්‍රියාවලිය ප්‍රමාද විය. අදාළ ගෙවීම 2025 වර්ෂයේදී සිදු කිරීමට බලාපොරොත්තු වේ. මීට අමතරව, අපගේ අනුමත මිල වැඩි කිරීමේ ඇස්තමේන්තුවට සාපේක්ෂව මිල වැඩි කිරීමේ මුදල සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු වීම නිසා අපේක්ෂිත බිල්පත් අගයන්ද යම් ප්‍රමාණයකට අඩුවී ඇත. එබැවින් පුරෝකථනය කළ පරිදි වෙන් කරන ලද අයවැය සම්පූර්ණයෙන්ම භාවිතා නොකළේය. වැය විෂයය අංක	මු.රෙ 50 අනුව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී ඒවා මුදල් වර්ෂය තුළ ඉටු කළ හැකි ශක්තිය ඇතුළත බව තහවුරු කරගත යුතු අතර වෙන්කරගත් ප්‍රතිපාදන වර්ෂය තුළදී අපේක්ෂිත කර්තව්‍ය සඳහා උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු බව.

		176-2-4-28-2105-0/17 උපදේශකයාට අත්තිකාරම් ගෙවීම සහ අර්ධ ගෙවීම සිදු කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණේ 2025 ජනවාරි බැවින් 2024 දී කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට නොහැකි වීම මත ප්‍රතිපාදන ඉතිරි විය.	
(ඇ)	අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේ දී 176-2-4-24-2104 වැය විෂයෙන් කුළුණු මතින් ඉදිවෙන වරාය පිවිසුම් අධිවේගී මාර්ගය ව්‍යාපෘතිය යටතේ Workshop Building Complex Construction Project සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් මඟින් රු.400,000,000 ක ප්‍රතිපාදන සලසාගෙන තිබූ අතර එම ප්‍රතිපාදනයෙන් රු.117,360,238 ක අධි ඇස්තමේන්තු වෙන්කිරීමක් සිදු වී ඇති අතර එය සලසා ගෙන තිබූ පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 29 ක් විය.	176-2-4-24-2104 2104-24-4-2-176 වැය විෂයයෙන් සඳහන් ව්‍යාපෘතිය සඳහා අවසාන ගෙවීම 2024 වර්ෂයේදී සිදු කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, විචලා අයිතම ප්‍රමාණය පිළිබඳ සාකච්ඡා හේතුවෙන් මෙම ක්‍රියාවලිය ප්‍රමාද විය. අවසන් කිරීම් මත, අවසාන ගෙවීම සහ රඳවා තබා ගත් ගෙවීම යන දෙකම 2025 වර්ෂයේදී සිදු කිරීමට බලාපොරොත්තු වේ. මීට අමතරව, අපගේ අනුමත මිල වැඩි කිරීමේ ඇස්තමේන්තුවට සාපේක්ෂව මිල වැඩි කිරීමේ මුදල සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස මිල ඉහළ යාමේ අඩුවීම හේතුවෙන් අපේක්ෂිත බිල්පත් අගයන්ද යම් ප්‍රමාණයකට අඩුවී ඇත. එබැවින් මුලින් පුරෝකථනය කළ පරිදි වෙන් කරන ලද අයවැය සම්පූර්ණයෙන්ම භාවිතා නොකරන ලදී.	මු.රෙ 50 අනුව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී ඒවා මුදල් වර්ෂය තුළ ඉටු කළ හැකි ශක්තිය ඇතුළත බව තහවුරු කරගත යුතු අතර වෙන්කරගත් ප්‍රතිපාදන වර්ෂය තුළදී අපේක්ෂිත කර්තව්‍ය සඳහා උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු බව.

3.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වාර්ෂික විසර්ජන පනත මගින් සලසා දෙනු ලබන ප්‍රතිපාදන ප්‍රශස්ත මට්ටමෙන් උපයෝජනය කිරීම හා අනුමත ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා බැදීම් හා බැරකම්වලට එළඹීම වලක්වාලීමේ අරමුණින් නිකුත් කරන ලද 2017 අප්‍රේල් 27 දිනැති හා අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයෙහි (ආ) හි දැක්වෙන පරිදි හඳුනාගනු ලැබූ බැදීම් පදනම් කරගෙන එම බැදීම්වලට අදාළ භාණ්ඩ හෝ සේවා ලබාගත් පසු ඒ සඳහා ගෙවීමට ඇති මුදල හා එළඹෙන ලද කොන්ත්‍රාත් සම්බන්ධයෙන් සහතික කළ වැඩවල වටිනාකම බැරකමක් ලෙස සටහන් කළයුතු බව දක්වා ඇත. එසේ වුවද, 2024 ජනවාරි, පෙබරවාරි හා මාර්තු වවුචර්පත් පරික්ෂාවේදී 2024 වර්ෂය සඳහා වූ බැරකම්වලට අදාළව රු.1,286,857 ක් මෙම මාසයන්හි දී නිරවුල් කර තිබුණු අතර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු 2024 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශන කට්ටලය තුළ බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ බැරකම් ලෙස දක්වා තිබුණේ රු.657,214ක වටිනාකමට අදාළ බැරකම් පමණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල බැරකම් රු.629,643ක් අඩුවෙන් දක්වා තිබුණි.	විගණන නිරීක්ෂණ නිවැරදි වන අතර ඉදිරි වර්ෂයේදී බැදීම් හා බැරකම්වලට එළඹීමේදී රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 255/2017 හා 2017.04.27 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කරන බව දන්වා සිටිමි.	චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රතිපාදන ප්‍රශස්ත මට්ටමෙන් උපයෝජනය කළ යුතු අතර ප්‍රතිපාදන අනුමත සීමාවන් ඉක්මවා බැදීම් හා බැරකම්වලට නොඑළඹිය යුතු බව.තවද, චක්‍රලේඛය ප්‍රකාරව එළඹෙන ලද බැරකම් සියල්ල මූල්‍ය ප්‍රකාශනවල සටහන් කිරීමට කටයුතු කළ යුතු බව.
(ආ)	2017 අප්‍රේල් 27 දිනැති හා අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය හා මු.රෙ 94 (1) වගන්තිය අනුව බැරකම් සහ වැය ප්‍රමාණය කිසිම විටක මුදල් වර්ෂය සඳහා ප්‍රතිපාදන මුදල නොඉක්මවිය යුතු බව දක්වා ඇති නමුත් 117-01-28-1408 වැය විෂයයට අදාළව රු.104,935ක් ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹී තිබුණි.	විගණන නිරීක්ෂණ නිවැරදි වන අතර එම වරද නැවත සිදු නොවීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.	වාර්ෂික ප්‍රතිපාදනවල මුදල් ඇත්නම් විනා වියදමක් සඳහා බැදීමක් ඇතිකර නොගතයුතු අතර බැරකම් සහ වැය ප්‍රමාණය මුදල් වර්ෂය සඳහා ප්‍රතිපාදන මුදල් නොඉක්මවිය යුතු බව.

3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නීති,රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය			
(i)	මුදල් රෙගුලාසි 185(2)	මුදල් ලැබෙන පිළිවෙළ අනුව මුදල් පොතේ සටහන් සඳහා අනුක්‍රමික ලෙස අංක යොදා ඒ එකිනෙක සටහන් තහවුරු කෙරෙන ලේඛනවලද එම අංකම දැමිය යුතු වූවත් රු.13,595,380ක වටිනාකමට අදාළව රිසිට්පත් අංක මුදල් පොතෙහි යොදා නොතිබුණි.	විගණන විමසුම නිවැරදි වන අතර එම වරද නිවැරදි කර රිසිට්පත් අංකය යෙදීමට කටයුතු කළ බව දන්වා සිටිමි.	මුදල් ලැබෙන පිළිවෙළ අනුව මුදල් පොතේ සටහන් සඳහා අනුක්‍රමික ලෙස අංක යොදා ඒ එකිනෙක සටහන් තහවුරු කෙරෙන ලේඛනවලද එම අංකම සටහන් කළ යුතු බව.
(ii)	මුදල්රෙගුලාසි 392 (ඇ) (III)	මුදල් පොතෙහි අවලංගු කළ චෙක්පතට මුල් සටහන ඉදිරියෙන් රතු තීන්තෙන් සුදුසු සටහනක් යෙදිය යුතු වුවද රු.14,850ක් වටිනා චෙක්පතක් මුදල් ගෙවීම සඳහා මුදල් පොතෙහි ඇතුළත් කර පසුව අවලංගු කොට ඇතත් ඒ පිළිබඳ මුදල් පොතේ කිසිදු සටහනක් යොදා නොතිබුණි.	විගණන විමසුම නිවැරදි වන අතර අවලංගු කළ චෙක්පත පිළිබඳ විස්තර මුදල් පොතට ඇතුළත් කරන ලදී.	මුදල් පොතෙහි අවලංගු කළ චෙක්පතට මුල් සටහන ඉදිරියෙන් රතු තීන්තෙන් සුදුසු සටහන් යෙදිය යුතු බව.
(iii)	මුදල් රෙගුලාසි 392 (ඇ) (IV)	අවලංගු වූ චෙක්පතක් වෙනුවට නිකුත් කරන ලද අලුත්ම චෙක්පත පිළිබඳ විස්තර ද, මුල් චෙක්පතට හරස් යොමු සහිත අලුත් සටහනක්ද, අලුත් චෙක්පත නිකුත් කළ දිනය යටතේ ව්‍යවහාරයෙහි පවත්නා මුදල් පොතෙහි රතු තීන්තෙන් සටහන් කළ යුතු අතර, මුදල් පිළිබඳ තීරු හිස්ව තැබිය	විගණන නිරීක්ෂණ නිවැරදි වන අතර 2024.10.25 දින අවලංගු කරන ලද 765673 දරණ චෙක්පත සඳහා නිකුත් කරන ලද 765674 චෙක්පත පිළිබඳ විස්තර මුදල් පොතේ සඳහන් කරන ලදී.	අවලංගු වූ චෙක්පතක් වෙනුවට නිකුත් කරන ලද අලුත්ම චෙක්පත මුල් චෙක්පතට හරස් යොමු සටහන්ද, අලුත් චෙක්පත නිකුත් කළ දිනය යටතේ ව්‍යවහාරයෙහි පවත්නා මුදල් පොතෙහි රතු තීන්තෙන් සටහන් කළ යුතු අතර මුදල් පිළිබඳ තීරු හිස්ව තැබිය යුතු බව.

		යුතුය. නමුත් 2024 ඔක්තෝබර් 25 වන දින අවලංගු කරන ලද 765673 දරන රු.497,612ක චෙක්පත අවලංගු කළ බව පමණක් සඳහන් කර තිබුණු අතර නිකුත් කරන ලද නව චෙක්පත (765674) පිළිබඳ කිසිදු සටහනක් මුදල් පොතෙහි යොදා නොතිබුණි.		
(iv)	මුදල් රෙගුලාසි 427 (2) (ඇ)	දෙපාර්තමේන්තු ගිණුම් පොත් භාණ්ඩාගාර පොත් සමඟ සැසඳුම යටතේ එක් එක් මාසය සඳහා වන සම්පූර්ණ වියදම, එකී දෙපාර්තමේන්තු විසින් අදාළ මාසය යටතේ අනුරූප භාණ්ඩාගාර පොත්වල දැක්වෙන ගණන් සමඟ නොකඩවා සැසඳිය යුතු වුවත් පොදු තැන්පත් ගිණුමේ මාසිකව ඉදිරියට ගෙන යන ලද ශේෂය දක්වමින් මාසිකව තුලනය කොට නොතිබුණි.	විගණන නිරීක්ෂණ නිවැරදි වන අතර පොදු තැන්පත් ගිණුම ඉදිරියේදී මාසිකව තුලනය කොට පවත්වාගෙන යාමට කටයුතු කරන බව දන්වා සිටිමි.	දෙපාර්තමේන්තු ගිණුම් පොත් භාණ්ඩාගාර පොත් සමඟ සැසඳුම යටතේ එක් එක් මාසය සඳහා වන සම්පූර්ණ වියදම, එකී දෙපාර්තමේන්තු විසින් අදාළ මාසය යටතේ අනුරූප භාණ්ඩාගාර පොත්වල දැක්වෙන ගණන් සමඟ නොකඩවා සැසඳිය යුතු බව.
(ආ)	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ			
(i)	ජාතික අයවැය චක්‍රලේඛ අංක 07/2022 හා භාණ්ඩාගාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ 2024.02.07 දිනැති BD/TRP/176/012/2024 ලිපියෙහි 2 වන ඡේදය	ජාතික අයවැය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2016 වර්ෂයේදී සංචිත රාජකාරි සඳහා ඩබල් කැබ් රථයක් කල්බදු පදනමින් ලබා ගැනීමට අනුමැතිය ලබාදී තිබුණ අතර එම කාලසීමාව 2021.10.31 දිනෙන් අවසන් වී තිබුණි. එය දීර්ඝ කිරීමක් වශයෙන් සලකා BD/TRP/176/01/2024 හා 2024.02.07 දිනැති ලිපියෙහි (2) මගින්ද අනුමැතිය ලබා දී ඇත්තේ සංචිත රාජකාරි සඳහා කල්බදු ක්‍රමය යටතේ මෝටර් රථයක් ප්‍රසම්පාදනය කරගැනීමට වුවද වාර්ෂිකව රු.2,548,800 මුදලකට කල්බදු පදනම මගින්	අමාත්‍යාංශයේ තිබෙන වාහන පැරණි වන බැවින්, අලුත්වැඩියා කටයුතු අවම කර ගැනීම, ඉන්ධන කාර්යක්ෂමතාව වැඩි කර ගැනීම හා එවකට පැවති රාජ්‍ය අමාත්‍යාංශ හා අමාත්‍යාංශ අහෝසිවීමත් සමඟ අමාත්‍ය කාර්ය මණ්ඩල විසින් භාවිතා කළ වාහන නැවත අමාත්‍යාංශය වෙත භාරදී ඇත. එම වාහන වශයෙන් Toyota Land Cruiser V8 ජීප් රථ, BMW කාර් රථය සහ මිට්සුබිෂි ඩබල් කැබ් රථ වේ. ඉහත කරුණු සැලකිල්ලට ගෙන වඩාත් සාධනීය හා ආර්ථික වශයෙන් වාසි දායක විසඳුම වශයෙන් කල් බදු ක්‍රමය	අවසර ලබා දී ඇති පරිදි සංචිත රාජකාරි සඳහා කල්බදු පදනමින් ලබා ගත් රථය එම කාර්යය සඳහා යෙදවිය යුතු බව.

		වාහනයක් ලබාගෙන එම රථය නිළධාරියෙකුට අනුයුක්ත කොට තිබුණි.	යටතේ ලබා ගත් වාහනය තවදුරටත් තබා ගැනීමට කටයුතු කර ඇත.	
(ii)	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ (30/2016)හි 3.1 වගන්තිය	වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය සතුව වාහන 45 පැවති අතර ඉන් වාහන 15 කට අදාළව ඉන්ධන පරීක්ෂාව සිදුකර නොතිබුණි.	චක්‍රලේඛයට අනුව මෙම අමාත්‍යාංශයේ වරාය හා සිවිල් ගුවන්සේවා අංශයෙහි සංචිත රාජකාරි සඳහා යොදවා ඇති වාහන 10 ක ඉන්ධන කාර්යක්ෂමතාව පරීක්ෂා කර ඒ පිළිබඳව වාර්තාවක් 2024.07.23 දිනැතිව රජයේ විගණන අංශය වෙත ඉදිරිපත් කර ඇත. ඉන්ධන පරීක්ෂාව ඉටු කිරීමට නොහැකිව ඉතිරිව ඇති වාහන සැලකිය යුතු සංඛ්‍යාවක් හිටපු අමාත්‍ය වරුන්ට හා මාණ්ඩලික නිලධාරින්ට අනුයුක්ත කර තිබූ වාහන අතර ඇතැම් වාහන අළුත්වැඩියා කටයුතු කිරීමට යොමු කිරීම හේතුවෙන් තාවකාලිකව ලබාදුන් වාහනවල ඉන්ධන කාර්යක්ෂමතාව නියමිත පරිදි පරීක්ෂා කිරීමට නොහැකිව ඇත. ඉන්ධන පරීක්ෂාව සිදු කිරීමට නොහැකි වූ සියළු වාහනද ප්‍රවාහන අංශය වෙත තාවකාලිකව ලබාදී ඇති කාර් රථය, අපහරණය කර/ කිරීමට යෝජිත කාර් රථ 09 හා ජනාධිපති කාර්යාලය වෙත භාරදී ඇති වාහන 02 හැර ඉතිරි වාහන සඳහා ඉන්ධන පරීක්ෂාව නැවත සිදු කර දින 45 ක් ඇතුළත ඒ පිළිබඳව වාර්තාවක් විගණන අංශය වෙත යොමු කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි.	ඉන්ධන පරීක්ෂාව නියමිත කාල පරාසයන් තුළ සිදුකළ යුතු බව.

4.මෙහෙයුම් සමාලෝචනය

4.1. දැක්ම හා මෙහෙවර

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2011 වර්ෂයේ ඉදිකරන ලද සූරියවැව ක්‍රිකට් ක්‍රීඩාංගනය ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවෙකුට ගෙවිය යුතු ණය පියවීම සඳහා 2017 දෙසැම්බර් 14 දින ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් මහජන බැංකුවෙන් ලබාගන්නා ලද රු.3,950,858,870ක ණය මුදලට වාර්ෂිකව සියයට 33.30 ක පොලියත් (පොලි අනුපාතය වෙනස් වේ) සමග වසර 15 ක කාලයක් තුළ ගෙවිය යුතු වන රු.11,796,877,071 ක ණය මුදලක් ලබා ගෙන තිබුණි. එම ණය ගෙවීම සඳහා ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශ හා අමාත්‍ය මණ්ඩල තීරණ මගින් අනුමැතිය ලබා දී තිබුණු අතර ඒ අනුව 2018 වර්ෂයේ සිට ණය පොලී ගෙවීමටත් 2021 වර්ෂයේ සිට ණය පොලි හා වාරික ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් මෙම අමාත්‍යාංශය වෙත සලසා දී තිබුණි. අමාත්‍යාංශයට අයත් නොවන මෙම ක්‍රීඩාංගනය සඳහා සමාලෝචිත වර්ෂයේදී ණය වාරික හා පොලී වශයෙන් රු.682,993,732 ක මුදලක් අමාත්‍යාංශයේ බැංකු පොලී හා මූල්‍ය වියදම් ලෙස වැය විෂයය - 176–2–4 – 23 - 1509 සහ 176-2-4-26-2509 (ශ්‍රී ලංකා වරාය අධිකාරිය, සූරියවැව, ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය - රාජ්‍ය ආයතන) යටතේ ගෙවීම් කර තිබුණි. මෙම වියදම අමාත්‍යාංශයේ පුනරාවර්තන වියදමෙන් සියයට 54.54 ක්, ප්‍රාග්ධන වියදමෙන් සියයට 28.69 ක් හා මුළු වියදමින් සියයට 38.03 ක් විය.මෙම ක්‍රිකට් ක්‍රීඩාංගනය ඉදිකර ඇති ඉඩම 2011 අප්‍රේල් 26 දින රජයේ ඉඩම් ආඥා පනතේ 23(2) ප්‍රකාරව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට පවරා ඇති නමුත් වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශට එහි කිසිදු අයිතියක් නොමැත. මේ අනුව අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ දරන ලද මෙම වියදම අමාත්‍යාංශයේ අරමුණු හා ක්‍රියාකාරකම්වලට අනුකූල නොවී තිබුණි.	හම්බන්තොට වරාය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ අතිරේක වැඩක් ලෙස සූරියවැව ක්‍රිකට් ක්‍රීඩාංගනය ඉදිකිරීම සිදුකර ඇත. ඒ සඳහා කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු හිඟ මුදල් නොගෙවීම නිසා කොන්ත්‍රාත්කරු ණය බේරුම් කරන ක්‍රියාවලියකට ගොස් තිබූ බැවින් එය අවලංගු කර කොන්ත්‍රාත්කරුට ගෙවීම් කිරීම සඳහා මහජන බැංකුවෙන් රු.3,950,858,869.57 ක ණය මුදලක් අමාත්‍ය මණ්ඩල තීරණයන්ට අනුව ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් මහජන බැංකුවේ ආයතන ශාඛාවෙන් ලබාගෙන ඇත. මෙම ණය මුදල සහ පොළිය වසර 15 ක් තුළදී (වසර තුනක සහන කාලයක් සහිතව) මුදල් අමාත්‍යාංශය විසින් ආපසු ගෙවීමේ එකඟතාවය මත ලබාගෙන ඇත. මෙම සූරියවැව ව්‍යාපෘතිය මෙම අමාත්‍යාංශයේ විෂය පථයට අදාළ නොවුවද ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය පරිදි අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සූරියවැව ක්‍රිකට් ක්‍රීඩාංගනය ණය මුදල ණයසේවාකරණ ගෙවීම් කටයුතු සිදුකිරීම සඳහා මෙම අමාත්‍යාංශය වෙත පවරා ඇත. එමෙන්ම ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මුදල් අමාත්‍යාංශය විසින් මෙම අමාත්‍යාංශය වෙත ලබාදී ඇති අතර විෂය පථයට අදාළ නොවුවද අමාත්‍ය මණ්ඩල තීරණ මත පැවරී ඇති රාජකාරිය ඉටු නොකර එයට අභියෝග කිරීමට අමාත්‍යාංශයට හැකියාවක් නොමැතිබව වැඩිදුරටත් දන්වා සිටිමි.	අමාත්‍යාංශයේ වියදම් එහි අරමුණු හා ක්‍රියාකාරකම්වලට අනුකූල විය යුතු බව.

4.2 **විදේශ ආධාර ව්‍යාපෘති**

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කුළුණු මතින් ඉදිවෙන වරාය පිවිසුම් අධිවේගී මාර්ගය ව්‍යාපෘතිය යටතේ රු.53,000,000 මුදලක් ගොඩනැගීම් සහ ඉදිකිරීම් සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටද සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණ අතර අදාළ කාර්යය අවසන් වී නොතිබුණි.	මෙම ව්‍යාපෘතිය සඳහා අවසාන ගෙවීම 2024 වර්ෂයේදී නිකුත් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, විචලන අයිතම ප්‍රමාණයන් පිළිබඳ සාකච්ඡා මෙම ක්‍රියාවලිය ප්‍රමාද කළේය. අවසන් කිරීමෙන් පසුව, අවසාන ගෙවීම සහ රඳවා ගැනීමේ ගෙවීම යන දෙකම දැන් 2025 වර්ෂයේදී නිකුත් කිරීමට අපේක්ෂා කෙරේ. ඊට අමතරව, අපගේ අනුමත මිල ඉහළ යාමේ ඇස්තමේන්තුවට සාපේක්ෂව මිල ඉහළ යාමේ මුදල සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, මිල ඉහළ යාමේ අඩුවීම හේතුවෙන් අපේක්ෂිත බිල්පත් අගයන් ද යම් දුරකට අඩු වී ඇත. එබැවින්, මුලින් පුරෝකථනය කළ පරිදි වෙන් කරන ලද අයවැය සම්පූර්ණයෙන්ම භාවිතා කර නොමැත.	බිල්පත් සඳහා ගෙවීම් කිරීමට කාලය නිශ්චය කිරීමේදී අයිතමවල විචලතාවයන් සලකා බැලීම හා වියදම් පුරෝකථනය කිරීමේදී මිල විචලතාවයන් පිළිබඳ සලකා බැලිය යුතු බව.
(ආ)	බටහිර බහළු පර්යන්ත (ii) සඳහා බටහිර දියකඩනය දිගු කිරීම පිණිස වන විස්තරාත්මක ව්‍යාපෘතියේ ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම් වෙනුවෙන් වෙන් කරන ලද රු.560,000,000 සහ රු.100,000,000ක සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණු අතර අදාළ කාර්යය අවසන් වී නොතිබුණි.	මෙම ව්‍යාපෘතිය ආසියානු සංවර්ධන බැංකුවේ TA 3425 SRI යන ප්‍රවාහන ව්‍යාපෘති සැකසීමේ පහසුකම (Transport Project Preparatory Facility – TPPF) යටතේ උපදේශකයෙකු පත් කිරීම සඳහා 2024 වර්ෂයේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කරන ලදී. ඒ අනුව, 2024 වර්ෂය සඳහා එම ව්‍යාපෘතියට අදාළව අත්තිකාරම් මුදල සහ අනෙකුත් මූලික ගෙවීමක් සඳහා අදාළ මුදල් වෙන් කර ඇත. කෙසේවෙතත්, ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමට සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට ගතවූ කාලය හේතුවෙන් මෙම ව්‍යාපෘතිය 2024 දී ආරම්භ කිරීමට නොහැකි විය. ඒ අනුව, 2024 වර්ෂයේදී අදාළ ව්‍යාපෘතිය සඳහා කිසිදු ගෙවීමක් සිදුකර නොමැත.	සැලසුම් සකස් කර ගැනීමට ප්‍රථම එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට යාමේදී අවශ්‍ය විය හැකි නිෂ්කාශනයන් සහ අනුකූලතාවයන් පිළිබඳ පූර්ව සලකා බලා වර්ෂය තුළ අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ හැකි දැයි සලකා බැලිය යුතු බව හා ඒ අනුව ප්‍රතිපාදන වෙන්කර ගත යුතු බව.

(ඇ)	කන්කසන්තුරේ වරාය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය හා ඉන්දියානු ආනයන හා අපනයන EXIM බැංකුව අතර ඇමරිකානු ඩොලර් මිලියන 45.27 ක ණය මුදලක් ලබා ගැනීමට ඩොලර් ණය ගිවිසුමකට 2018 ජනවාරි 10 දින අත්සන් තබා තිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට ණය ගිවිසුම අත්සන් කර වසර 04 කටත් වැඩි කාලයක් ගතවී ඇතත් වරායෙහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීමේ වැඩකටයුතු 2021 සැප්තැම්බර් මස ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණද 2024 දෙසැම්බර් 31 දින වනවිටත් මෙම ව්‍යාපෘතියේ ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කර නොතිබුණු අතර 2024 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව තුළ කන්කසන්තුරේ වරාය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ රු.මිලියන 4,591 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණි. එම ප්‍රතිපාදන සලසාගෙන තිබුණේ ප්‍රධාන වැය සඳහා රු. මිලියන 765 ක් හා ණය සඳහා රු.මිලියන 3,826 ක් වශයෙනි. එසේ වුවද වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවලට අනුව ඉහත සලසාගෙන තිබූ ප්‍රතිපාදනයන්ගෙන් කිසිදු වියදමක් දරා නොතිබුණි.	KKS වරාය ව්‍යාපෘතියේ පුනරුත්ථාපනය 2020 ඔක්තෝබර් මාසයේ ආරම්භ කර ඇති අතර මූලික සැලසුම් කටයුතු, පූර්ව සුදුසුකම් ලේඛනය සහ සවිස්තරාත්මක ව්‍යාපෘති වාර්තාව සකස් කිරීම අවසන් කර උපදේශකයන් සඳහා රු.මිලියන 196.3 ගෙවීම් කර ඇත. ඉන් පසු ව්‍යාපෘතිය මේ දක්වා ඉන්දියාවේ EXIM බැංකුවෙන් පූර්ව සුදුසුකම් ලේඛනය සහ ණය දීර්ඝ කිරීම සඳහා අනුමැතිය බලාපොරොත්තුවෙන් පවතී. මේ සඳහා විසඳුම් සෙවීම සඳහා, ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම සඳහා ඉන්දීය රජය ඇමරිකානු ඩොලර් මිලියන 63.65 ක ප්‍රදානයක් යෝජනා කර ඇත. කෙසේ වෙතත්, මෙම ප්‍රදානය තවමත් අවසන් කර නොමැත. එබැවින්, පුරෝකථනය කරන ලද විසර්ජන කාලසටහනට අනුව අයවැය ප්‍රතිපාදන භාවිතා කර නොමැත.එබැවින්, ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීම සඳහා මූල්‍ය මූලාශ්‍රය (ණය, ප්‍රදාන හෝ ආයෝජන යෝජනාව) අවසන් කළ යුතුය.	සැලසුම් සකස් කර ගැනීමට ප්‍රථම එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට යාමේදී අවශ්‍ය විය හැකි නිෂ්කාශනයන් සහ අනුකූලතාවයන් පිළිබඳ පූර්ව සලකා බලා ප්‍රතිපාදන වෙන්කර ගැනීමට කටයුතු කළ යුතු බව .

4.3 දේශීය අරමුදල්වලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	හිඟුරක්ගොඩ ජාත්‍යන්තර ගුවන්තොටුපොළ සංවර්ධන ව්‍යාපෘතියේ ගොඩනැගිලි හා ඉදිකිරීම් වෙනුවෙන් වෙන්කර තිබූ රු.2,000,000,000ක ප්‍රතිපාදනයෙන් සියයට 75ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණ අතර අදාළ කාර්යය අවසන් වී නොතිබුණි.	මෙම ව්‍යාපෘතිය සඳහා රු.2,000,000,000 ක මුදලක් 2024.04.03 වන දින ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත හිඟුරක්ගොඩ ගුවන් තොටුපල සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් ලබා දෙන ලදි. ඉන්පසු මෙම ව්‍යාපෘතියට අදාළව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම වෙනුවෙන් වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යාංශය විසින් 2024.06.13 දින අමාත්‍ය	සැලසුම් සකස් කර ඇති පරිදි අදාළ කාලසීමාව තුළ ව්‍යාපෘතිය නිම කිරීමට කටයුතු කළ යුතු බව.

මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2024.07.02 ලැබී ඇත. අනුමැතිය ලැබීමෙන් පසු ශ්‍රී ලංකා ගුවන් හමුදාව සහ ව්‍යාපෘති උපදේශන සමාගම අතර කොන්ත්‍රාත්තු ගිවිසුමට 2024.08.13 වන දින අත්සන් තබන ලද අතර ඉන් පසු දින සිටම ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීමේ කටයුතු නොකඩවා සිදු කළද 2024.12.31 දින වන විටත් මෙහි ඉදිකිරීම් කටයුතුවල භෞතික ප්‍රගතිය සම්පූර්ණ කිරීමට හැකි වූයේ සියයට 34 ක් පමණි.

4.4 ප්‍රසම්පාදනයන්

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	රථවාහනයක් අළුත්වැඩියා කිරීම සඳහා මිල කැඳවීමේදී සැපයුම්කරු විසින් ඉදිරිපත් කළ Vat සහිත ඇස්තමේන්තුව රු. 2,307,578 ක් වූ අතර මුදල් ලබාගැනීම සඳහා ඉදිරිපත් කරන ලද රු.2,201,247 ක ඉන්වොයිස් පත්‍රයෙහි Vat ඇතුළත් නොකර වට්ටමක් ලබාදුන් බව දක්වා තිබුණි. දේශිය ආදායම් දෙපාර්තමේන්තුව විසින් අංක CGIR/2021/(1)-02 හා 2021.01.09 දිනැති චක්‍රලේඛය මගින් දක්වා ඇත්තේ රජයට Vat ප්‍රේෂණය නොකර රජයට ලැබිය යුතු බදු ආදායම් පුද්ගලයන් විසින් රඳවාගෙන ඇති බැවින් රාජ්‍ය ආයතන විසින් සැපයුම්කරුවන් වෙත කරන ලද ගෙවීම් පිළිබඳ විස්තර එහි සඳහන් අකෘති පත්‍රයට අනුව එම දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු බවය. නමුත් ඉහත ඉන්වොයිසියට අදාල රු.335,860 ක Vat ගෙවීම් පිළිබඳ විස්තර දේශිය ආදායම් බදු දෙපාර්තමේන්තුවට යවා නොතිබුණි.	අංක KX – 2992 දරණ කාර් රථයේ ස්වයංක්‍රීය ගියර් පද්ධතියේ අළුත්වැඩියාව සඳහා වැට් අගය වෙනම සඳහන් කරමින් රු.2,307,579 සමස්ත මිල ඇස්තමේන්තුව නියෝජිත ආයතනය විසින් ඉදිරිපත් කර ඇත. ඒ අනුව අළුත්වැඩියාවෙන් පසුව රු.97,394 ක වට්ටමක් ලබාදීමෙන් අනතුරුව සමස්ත බිල්පත (වැට් අගයද සහිතව) රු. 2,201,747 වේ. ඒ අනුව එම අගයෙන් අත්තිකාරම් අගය අඩු කර රු.2,201,747 - රු.1,153,764 = රු.1,047,985 මුදල පමණක් ගෙවීම් කිරීමට කටයුතු කර ඇති අතර විගණන විමසුමෙහි සඳහන් පරිදි වැඩියෙන් ගෙවීමක් සිදු කර නොමැත.	චක්‍රලේඛය අනුව VAT ගෙවිය යුතු ආයතනයකින් සේවාවක් ලබාගත් පසු එම ආයතනය විසින් අය කරන ලද VATවලට අදාළ විස්තර දේශිය ආදායම් දෙපාර්තමේන්තුව වෙත යැවිය යුතු බව.

4.5 කළමනාකරණ දුර්වලතා

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වවුචරපත් 11 කට අදාළව එකතුව රු.154,600ක මුදල් භාරගත් පුද්ගලයන් විසින් භාරගත් මුදල හා මුදල් භාරගත් දිනය සඳහන් කිරීමකින් තොරව අත්සන පමණක් යොදා මුදල් භාරගෙන ඇත. ඒ අනුව මුදල් ලබාගත් නිලධාරියා අදාළ මුදල නිවැරදිව භාරගත් බවට තහවුරු කර ගැනීමට නොහැකි විය.	විගණන විමසුම නිවැරදි වන අතර එම වරද නැවත සිදු නොවීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.	මුදල් බාරගත් පුද්ගලයන් විසින් බාරගත් මුදල හා මුදල් බාරගත් දිනය සඳහන් කළ යුතු බව.
(ආ)	2024 ඔක්තෝබර් 25 සිට 2024 දෙසැම්බර් 19 දක්වා පොදු තැන්පතු ගිණුමෙන් රු.31,050ක වටිනාකමින් යුත් මුදල් ආපසු ගෙවීම් සිදු කර තිබුණද, ඒවාට අදාළව ගෙවීම් සිදුකළ දිනය සඳහන් කර නොතිබුණි.	විගණන විමසුම නිවැරදි වන අතර එම වරද නැවත සිදු නොවීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.	පොදු තැන්පතු ගිණුමෙන් මුදල් ආපසු ගෙවීම් සිදු කරනු ලබන විට ඒවාට අදාළව ගෙවීම් සිදුකළ දිනය සඳහන් කළ යුතු බව.
(ඇ)	වැඩ තහනම් කර තිබුණු නිලධාරියෙකුගෙන් අමාත්‍යාංශය වෙත අය වියයුතුව තිබුණු රු.293,470 ක ණය ශේෂය වර්ෂ 20 කට අධික කාලයක සිට හිඟහිටව පැවැත එමින් තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ශේෂය අයකර ගැනීමට අමාත්‍යාංශයට නොහැකි වී තිබුණි. මෙම නිරවුල් නොවූ ණය ශේෂයන් දිගින් දිගටම ණය ලේඛනවල ඉදිරියට ගෙන එමින් පැවතුණි.	ඡේදයේ සඳහන් නිළධාරියා වන ජේ.ඒ.ආරියසේන මහතා පදිංචි රත්මලාන ප්‍රාදේශීය ලේකම් ගෙන් තොරතුරු විමසූ විට ඔවුන් විදේශගතව ඇති බව දන්වා ඇත.ඒ අනුව ඔවුන් විදේශගතව ඇත්තේ කුමන රටකටද යන්න පිළිබඳව ලේකම්, විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් 2024/11/08 දිනැති ලිපිය මඟින් විමසා ඇති අතර ඒ සඳහා පිළිතුරක් නොලැබුනු අතර 2025/01/07 දිනැති පළමු සිහිකැඳවීම් ලිපිය යොමු කර ඇත. ඔහුගේ බිරිඳට විශ්‍රාම වැටුප් හිමිබව තහවුරු වී ඇති අතර ඒ අනුව 2023.07.08 දිනැතිව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිපියක් යොමුකර ආරියසේන මහතාගේ බිරිඳගේ විශ්‍රාම වැටුපෙන් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉල්ලා සිටින ලදී.	හිඟ ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතු බව.

5. යහපාලනය

5.1 විගණන හා කළමනාකරණ කමිටුව

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2019 ජනවාරි 12 දිනැති අංක /01-2019 දරන අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ චක්‍රලේඛයේ 5.3 ඡේදයේ උපදෙස් ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් අවම වශයෙන් කාර්තුවකට වරක් පැවැත්විය යුතු වුවත් 2024 වර්ෂයේ පවත්වා ඇත්තේ රැස්වීම් 3 ක් පමණි.	සිව්වන කාර්තුවට අදාළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම පැවැත්වීමට අදාළ කටයුතු සූදානම් කරමින් සිටි නමුත් 2024 නොවැම්බර් මස 14 වන දින මහ මැතිවරණය පැවැත්වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස එම කාලපරිච්ඡේදය තුළ අමාත්‍යාංශ, අමාත්‍යාංශ ලේකම්වරු හා අමාත්‍යාංශයේ විෂය පථය වෙනස් වීමක් ද සිදු විය. එසේම අමාත්‍යාංශය යටතේ පැවති ආයතනවල වෙනස් වීමක් සිදු වූ අතර එම ආයතනවල සභාපතිවරු මාරු වීමක් ද සිදු වූ බැවින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමට අවශ්‍ය වන තොරතුරු ලබා ගැනීමේ දුෂ්කරතාවයන් නිසා නිසිපරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට නොහැකි විය.	චක්‍රලේඛය අනුව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් අවම වශයෙන් කාර්තුවකට වරක් පැවැත්විය යුතු බව.

6. මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය

අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනට පැවති අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්යමණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ.

සේවක වර්ගය	අනුමත සංඛ්‍යාව	තථ්‍ය සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	22	20	02
තෘතියික මට්ටම	03	01	02
ද්විතියික මට්ටම	61	49	12
ප්‍රාථමික මට්ටම	27	26	01
එකතුව	113	96	17

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අමාත්‍යාංශයේ ස්ථිර කාර්යමණ්ඩලයේ මුළු පුරප්පාඩු සේවක සංඛ්‍යාව 17 ක් වී තිබුණි. එම පුරප්පාඩු පිරවීම සඳහා වාර්තාවේ දිනය දක්වා කටයුතු කර නොතිබුණි.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ආයතනයේ ස්ථිර කාර්යමණ්ඩලය මුළු පුරප්පාඩු සංඛ්‍යාව 17 ක් වී තිබුණි. මෙම පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙතින් ඉල්ලීම් ලිපි ඉදිරිපත් කරන ලද අතර එම පුරප්පාඩු සම්පූර්ණකර නොමැත.

නිර්දේශය

අමාත්‍යාංශයේ කාර්යය හා කර්තව්‍යයන් ඉටුකිරීමට ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් පවත්වා ගත යුතු බව.